# තනි පුද්ගල ව්‍යාපාර නාම ලියාපදිංචිය

**අවශ්‍ය ලිපිලේඛන**

1. (බ.ප.) ආර් 1 අයදුම්පත්‍රය
2. ග්‍රාම නිලධාරී වාර්තාව
3. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපත
4. ව්‍යාපාරික ස්ථානෙයහි හිමිකාරීත්වය පැවරී ඇති බව තහවුරු කිරීම සඳහා ලියාපදිංචි බඳු ගිවිසුමෙහි / ඔප්පුවෙහි / කුලී ගිවිසුමෙහි නොතාරිස්වරයෙකු විසින් සහතික කරන ලද පිටපත [1]
5. ව්‍යාපාර හිමිකරුගේ පදිංචිය වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක නම්, පදිංචිය තහවුරු කිරීම සඳහා D.S.04 ආකෘතිය ලබා ගැනීම සුදුසුය.
6. වරිපනම් තක්සේරු දැන්වීම
7. ආරම්භක ප්‍රාග්ධන මූල්‍ය වටිනාකම සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක්
8. ව්‍යාපාර ස්වභාවය අනුව ඉදිරිපත් කළ යුතු ලියවිලි හා නිර්දේශ [2]
9. ගාස්තු ගෙවීම
10. රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවිය හැකි වෙනත් ලියවිලි

## 1. <u>ව්‍යාපාර ස්ථානයේ හිමිකම තහවුරු කිරීම</u>

ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා අදාල ව්‍යාපාරික ස්ථානයේ හිමිකම ව්‍යාපාර හිමිකරු / හිමිකරුවන් වෙත පැවරී ඇති ආකාරය තහවුරු කර ගැනීම අවශ්‍ය වේ. ඒ සඳහා, පහත සඳහන් ලිපිලේඛන කැඳවීමට සිදු විය හැකිය.

### 1.1 ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ඔප්පු / තෑගි ඔප්පු/ බදුකුලීගිවිසුම්

- නොතාරිස්වරයෙකු විසින් සහතික කරන ලද **<u>ලියාපදිංචි ඔප්පුවෙහි / බදුකුලී ගිවිසුමෙහි</u>** සත්‍ය පිටපත
- ජීවිත භුක්තිකරුවන් නම් කර ඇත්නම් ව්‍යාපාරය කරගෙන යාමට ඔවුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවට සඳහන් කරමින් ඔවුන් විසින් සාම විනිසුරු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේ අත්සන් තබා ලබාගත් දිවුරුම් ප්‍රකාශය සහ අනන්‍යතාවය තහවුරු කිරීමේ ලේඛනයක සත්‍ය පිටපත්
- ජීවිත භුක්තිකරුවන් ජීවතුන් අතර නොමැතිනම්, මරණ සහතිකයේ සත්‍ය පිටපත්

### 1.2 ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ප්‍රකාශන ඔප්පු

නොතාරිස් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද **<u>ලියාපදිංචි ප්‍රකාශන ඔප්පුවෙහි</u>** පිටපතට අමතරව ඔප්පුව හිමිකරුගේ වසර 10 ට වැඩි පදිංචිය තහවුරු කරමින් අදාළ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය (DS04)

### 1.3 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය/ නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයන් හරහා නිකුත් කර ඇති ඔප්පු/ බදු ඔප්පු

- ඔප්පුව/බදු ගිවිසුම/ කඩකුලී ගිවිසුමෙහි නොතාරිස්වරයෙකු විසින් සහතික කළ පිටපත
- අදාල ස්ථානයේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත කරුණු සඳහන් කරමින් ව්‍යාපාර නාම ලියාපදිංචි අයදුම්කරු විසින් සාම විනිසුරු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේ අත්සන් තබා ලබාගත් දිවුරුම් ප්‍රකාශය
  - අවට මහජනතාවට අවහිරයක් පීඩාවක් නොවන පරිදි,
  - රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් කලින් කලට පනවනු ලබන සියලු නීති රීති හා කොන්දේසි වලට යටත්ව,
  - යම් හෙයකින් එම ස්ථානය රජයට පවරා ගැනීමක් හෝ ඊට අදාල වූ යම් ක්‍රියාමාර්ගයක් ගැනීමේදී ව්‍යාපාරය එම පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට යටත්ව ද ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බව දිවුරුම් ප්‍රකාශයෙහි ඇතුළත් විය යුතු වේ.
- බදු ගිවිසුමක් පමණක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක නාගරික සංවර්ධන අධිකාරියේ විරෝධතාවයක් නොමැති බවට තහවුරුවක්

**1.4 ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ඔප්පුව / බදුකුලී ගිවිසුම ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ නමට නොමැති විට**

- නොතාරිස් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ලියාපදිංචි ඔප්පුවෙහි පිටපත
- ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බවට සඳහන් කරමින් ඔප්පු හිමිකරු/ හිමිකරුවන් විසින් සාම විනිසුරු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේ අත්සන් තබා ලබාගත් දිවුරුම් ප්‍රකාශය
- ඔප්පු හිමිකරු/ හිමිකරුවන් ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ ලේඛනයක (ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍රයේ/ රියදුරු බලපත්‍රයේ) සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**1.5 ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ව්‍යාපාර ස්ථානයට අදාළ ඔප්පුව යම් බැංකුවක්/ මූල්‍ය ආයතනයක් වෙත උකස් කර ඇත්නම්**

- අදාල ආයතනය විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරනු ලැබූ ඔප්පුවේ ඡායා පිටපත සමඟ එම ආයතනයෙන් නිකුත් කළ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බව තහවුරු කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

**1.6 ඔප්පුවෙහි / බදු ඔප්පුවෙහි / කුලී ගිවිසුමෙහි උපලේඛනයෙන් ව්‍යාපාර ලිපිනය තහවුරු නොවන අවස්ථාවල දී,**

- වරිපනම් දැන්වීම මඟින් නිවැරදිව ව්‍යාපාරික ලිපිනය තහවුරු වන්නේ නම් වරිපනම් තක්සේරු දැන්වීම / වරිපනම් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපත හෝ ව්‍යාපාර හිමිකරු විසින් එකී ලිපිනයන් මඟින් දක්වා ඇත්තේ එකම ස්ථානය බවට තහවුරු කිරීමේ දිවුරුම් ප්‍රකාශය හෝ අදාළ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන එකී ලිපිනයන් මඟින් දක්වා ඇත්තේ එකම ස්ථානය බවට තහවුරු කිරීමේ ලිපියක් හෝ ඉදිරිපත් කළ යුතුය.

## 2. <u>ව්‍යාපාර ස්වභාවය අනුව ඉදිරිපත් කළ යුතු ලියවිලි හා නිර්දේශ</u>

ඇතැම් ව්‍යාපාර ස්වභාවයන් අනුව මහජන යහපත උදෙසා වැඩිදුර පරීක්ෂා කළ යුතුයැයි පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්ට හැඟී යන අවස්ථාවන්හි දී සහ ඇතැම් රාජ්‍ය ආයතන විසින් කර ඇති ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව එකී ව්‍යාපාර සම්බන්ධයෙන් සම්බන්ධ වන වෙනත් ආයතන හෝ පාර්ශවයන් වෙතින් නිර්දේශයන් හෝ තහවුරුකිරීම් ඉල්ලා සිටීමට පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර්ට බලය ඇත.

(2013-09-25 දිනැති 1829/32 අංක දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත 2011 අංක 05 දරන බස්නාහිර පළාත් ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තියේ 32(1) වගන්තිය යටතේ සාදන ලද රීති - රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවිය හැකි වෙනත් ලියවිලි ඇතොත් ඒවා)

## <u>ව්‍යාපාර ස්වභාවය අනුව ඉදිරිපත් කළ යුතු ලියවිලි හා නිර්දේශ</u>

| අනු අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | අවශ්‍ය ලිපිලේඛන හා නිර්දේශයන් |
|---|---|---|
| 01 | ආයුර්වේදය සම්බන්ධ බෙහෙත්ශාලා, රෝහල්, චිකිත්සා ආයතන, ඔසුහල්, ඖෂධ ගබඩා, පැළ තවාන් හා ඒ සම්බන්ධ ව්‍යාපාර | පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ එකඟතාවය |
| 02 | මැණික් හා ස්වර්ණාභරණ අලෙවිය, නිෂ්පාදනය සම්බන්ධ ව්‍යාපාර | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිර්දේශය ( ව්‍යාපාරයේ නමට හෝ පුද්ගල නමට) |
| 03 | ව්‍යාපාරයට අදාල වෘත්තීය සපුරාලීම අවශ්‍යවන අවස්ථාවල | ව්‍යාපාර හිමිකරුගේ පෞද්ගලික නමට නිකුත් කරන හෝ ව්‍යාපාරයේ සේවය කරන අයගේ නමට නිකුත් කරන සුදුසුකම් සනාථ කරන සහතික පිටපත් |
| 04 | සිගරට්, පයිප්ප, දුම්කොළ, සුරුට්ටු, බීඩි සඳහා වූ අමුද්‍රව්‍ය, නිම්භාණ්ඩ නිෂ්පාදනය, ගබඩා කිරීම, ආනයනය, අපනයනය සඳහා | සුරාබදු කොමසාරිස්ගේ එකඟතාවය |
| 05 | ඖෂධ ශාලා | වෛද්‍ය තාක්ෂණ හා සැපයීම් අංශයේ එකඟතාවය හා<br>ඖෂධවේදීන් සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය |
| 06 | උපදේශනය සම්බන්ධ ව්‍යාපාර | අදාල ක්ෂේත්‍රය සම්බන්ධව වෘත්තීය සුදුසුකම් |
| 07 | පෙර පාසල් | බස්නාහිර පළාත් පෙර පාසල් අධ්‍යක්ෂකගේ නිර්දේශය |
| 08 | දිවා සුරැකුම් මධ්‍යස්ථාන | අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සේවයේ නියුතු මුල් ළමාවිය සංවර්ධන සහකාරගේ නිර්දේශය ප්‍රාදේශීය ලේකම් අනු අත්සනින් |
| 09 | රූපලාවන්‍යාගාර,රූපලාවන්‍ය නිශ්පාදන වෛද්‍යමධ්‍යස්ථාන, සුවඳ විලවුන් වර්ග අලෙවිය | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිර්දේශය / මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශය සහ වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික |
| 10 | ඉන්ධන පිරවුම්හල් | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ එකඟතාවය |
| 11 | පොලිතින්, ප්ලාස්ටික, තීන්ත වර්ග, ඇසිඩ් නිෂ්පාදන ගබඩා කර තැබීම, අලෙවිය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්ත | මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය |
| 12 | දැව ආශ්‍රිත කර්මාන්ත, දැව කැපීම, දැව ප්‍රවාහනය | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාවය |
| 13 | මුද්‍රණාල | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිර්දේශය |
| 14 | ශ්‍රමිකයන් සපයන ව්‍යාපාර | අයිතිකරුවන් නමින් ලබාගත් පොලිස් නිෂ්කාශන වාර්තාව |
| 15 | කාමර, නවාතැන් පහසුකම් සැපයීම, ගෙස්ට් හවුස්, සම්භාහන මධ්‍යස්ථාන | මහජන විරෝධතා නොමැති බවට ග්‍රාම නිලධාරී නිර්දේශය සහිත ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව සහ අදාල ස්ථානය සහ අයිතිකරුවන් සම්බන්ධයෙන් පොලිස් නිෂ්කාශන වාර්තාව |

| | | |
|---|---|---|
| 16 | සත්ත්ව ගොවිපොළ | පශු වෛද්‍ය නිලධාරිගේ නිර්දේශය |
| 17 | ආහාරපාන නිෂ්පාදනය සම්බන්ධ ව්‍යාපාර කටයුතු | මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාව |
| 18 | පලිබෝධනාශක, කෘමිනාශක, රසායනික පොහොර අලෙවිසැල් | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය |
| 19 | යම් ආයතනයක වෙළඳ නියෝජිතයෙකු ලෙස කටයුතු කරන්නේ | එම ආයතනයේ නියෝජිත ලෙස පත් කර ඇති බවට ලිපිය |
| 20 | විදේශ රැකියා ඒජන්සි | විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බලපත්‍රය (වෙනස්කම් ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාවේ අනිවාර්ය වේ. මුල් ලියාපදිංචියේ දී පොලිස් නිෂ්කාශණ වාර්තාව ප්‍රමාණවත් වේ.) |
| 21 | ජනමාධ්‍ය අමාත්‍යාංශ නිර්දේශ | රූපවාහිනී, රේඩියෝ,කේබල්,සැටලයිට්,PEO TV නාලිකා සඳහා වන ව්‍යාපාර සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශ නිර්දේශ ලබාගත යුතු වේ. |
| 22 | ජංගම දුරකථන වෙළඳ කටයුතු | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලියාපදිංචිය (වෙනස්කම් ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාවේ අනිවාර්ය වේ.) |
| 23 | මෙයට අමතරව රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවනු ලබන වෙනත් ලේඛන | |